# මඩු ශාන්තිකර්මවල පුද ලබන පත්තිනි දෙවියන් හා අනෙකුත් දෙවිවරුන් අතර සම්බන්ධය ඇගයීම

# හැඳින්වීම

බෞද්ධ ජනතාව තුළ මහත් ගෞරවාදරයට පත්වූ දෙවි දේවතාවුන් රාශියක් ලාංකික යාග ශාන්තිකර්මවල මෙන්ම ප්‍රාදේශිය දේවාලවල පුද ලබනු දක්නට ඇත. ඒ අතර ස්වදේශීය සහ විදේශීය සම්භවයක් ඇති දෙවිවරු ද ඇත. ලාංකික සිංහල බෞද්ධයන් අතර දේව විශ්වාස පිළිබඳ කාලානුරූපියව වර්ධනීය සහ පසු බැසීම් පවතියි. ක්‍රි. පූ 1500 දී පටන් ලංකාවේ ආසන්න රාජ්‍යයවන ඉන්දියාවේ ආර්ය භාෂාවන් පැතිර ගිය අතර ඒවා කථා කළවුන් ඍග් වේදයේ එන අග්නි, සූර්ය, ලක්ෂමී, කාලි, විෂ්ණු, බ්‍රහ්ම ආදී දෙවියන් අදහන්නට විය.[1] මේ අතරින් ඇතැම් දෙවියන් සතියේ එක් එක් දිනයන් හි දී විවිධ විලාශයෙන් පෙනී සිටින බවට ගැමි ජනයා අතර විශ්වාසයක් ඇත. ඉන්දියාවේ ගෞරවාදරයට පත් පත්තිනි ඇදහීම ගෞතම බුදුන් සමයේ පටන් ජනප්‍රියතාවයට පත් වුව ද ලාංකික ඉතිහාසයේ පඬුවස්දෙව් රජු සමයේ මෙම දේව ඇදහීම ව්‍යාප්තවන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. එකල චිත්තරාජ කාලවේල යක්ෂයින් ඇදහීම ද ලංකාවේ පැවති බවට සාක්ෂි ඇත.

පත්තිනි ඇදහීමට පෙර ලංකාව තුළ විෂ්ණු දේව ඇදහීම පවතින්නට ඇත.[2] විජය ලංකාවට පැමිණි දින විජයගේ ආරක්ෂාවට පිරිත් හුය බැඳීම විෂ්ණු අතින් සිදුවූ බව ජන ප්‍රවාදයේ කියැවේ. දේව විශ්වාස සහ දෙවි වරු ඇදහීම ප්‍රාග් බෞද්ධ සමාජයේ පටන්ම තිබූ බවට සාක්ෂි බෞද්ධ පොත පත ඇසුරෙන්ද පෙනෙන්නට ඇත.[3] ඒ අනුව විෂ්ණු දෙවියන්ට දස අවතාරයක් තිබූ බවත්, බෞද්ධ ශාසනය රකිමින් ලංකා වාසී ජනයාට සෙත් ශාන්ති සලසමින් සිටිබව පැවසේ.[4] කෙසේ වුවද පත්තිනි ඇදහීම ලංකාව පුරා ව්‍යාප්ත වූවා යැයි සැලකෙන්නේ ගජබාහු රජු අවධියේය. ඇතැම් විට ලංකාවේ පැවති පත්තිනි ඇදහීම වර්ධනය වීමට බලපෑ හේතුව ලෙස ගජබාහු රජු විසින් පත්තිනි මෑණියන්ගේ රන් සළඹ මෙරටට වැඩමවීම සඳහන් කළ හැකි ය. ඒ අතරට බෞද්ධයින්ගේ පූජනීය වූ ගෞතම

1. යටවර, එම්. ඩී. එම්. එස්, **දේවාල උපත**, ආරිය ප්‍රකාශකයෝ, කොළඹ, ප්‍රථම මුද්‍රණය, 2005, **(දේවා. උ.)** 5 පිටුව.

2. දේවා. උ. 57 පිටුව.

3. දේවා. උ. 25 පිටුව.

4. ජයසිංහ, විජය ශ්‍රී. **හෙළබිම පුද ලබන දෙවිවරු සහ දේව පූජා විධි 01** (හෙ. පු. දෙ. 01 ), වාසනා ප්‍රකාශකයෝ, දංකොටුව, 2005, 18 පිටුව.

බුදුන්ගේ පාත්‍රා ධාතුව වැඩම වූ බැවින් මේ අවස්ථා දෙකම සිහි කොට පත්තිනි දෙවියන් වෙනුවෙන් දේවාලයක් කරවා පෙරහැර පවත්වන්නට විය.[1] එකල ඉන්දියාවේ පාලකයා වූයේ සෙංගුට්ටුවාන් රජු බව පැවසේ. ගජබා රජුගෙන් පසු රජ පැමිණි සියලු රජ වරු මෙම ඇසළ පෙරහැර පවත්වන්නට විය. දශක දොළහක් පමණ කට වහරින් පැමිණි මෙම විස්තර ග්‍රන්ථවලට ඇතුළත් වන්නේ පසළොස්වන සියවසේ දී ය. මහාවංසයේ මේ පිළිබඳ සඳහන් නොවූයේ දේව සංකල්පයක් ඉස්මතු වුවහොත් එය බෞද්ධාගමට පහරක් වේ යැයි අනුමාන කරන්නට වූවා දැයි සැක පහළ වේ. දේවාල උත්පත්තියේ සඳහන් ආකාරයට පඬුවස් දෙව් රජුගේ කාල වකවානුවේ නවගමුවේ පළවන පත්තිනි දේවාලව ඉදිකර ඇත. ඉන් අනතුරුව සීනිගම පත්තිනි දේවාලයක් ඉදිකර ඇත. දෙවොල් ගොඩ බැසීමෙන් පසු පඬුවස් රජුගේ නියමයෙන් ගම්වර අටක් දී දෙවොල් දේවාලයක් ද ඉදිකළ බව කියැවේ.[2] පත්තිනි දේව ඇදහීම රටපුරා ව්‍යාප්ත වන්නට මෙම පෙරහැර මංගල්‍යය මූලික වන්නට ඇත. පත්තිනි දෙවියන් වෙනුවෙන් පුද පූජා දුන්විට සියළු රෝග දුරු වන බවටත් බවබෝග සම්පත් වඩ වඩාත් දියුණු වී වගාවට හානි කරන සතුන්ගෙන් වගාව ආරක්ෂා කර දී සියළු දෙනාට යහපතක් සිදුවන බවට කාලයක සිට ලංකාව තුළ දේව විශ්වාසයක් ගොඩනැගී ඇත. වර්තමානයේ පත්තිනි දෙවියන් වෙනුවෙන් පුද පූජා පැවැත්වීම්වල අඩුවක් නැත. ප්‍රධාන දේවාල ආශ්‍රිතව දේව ඇදහීම දිනපතා සිදුවේ. වර්තමානයේ දී නාගරීකරණය වී මිනිසුන්ගේ විශ්වාසයන් වෙනස් වෙමින් තිබෙන යුගයක වුවද පත්තිනි දේව විශ්වාසය කිසිත් අඩුවක් පෙනෙන්නට නොමැත. භාරහාර වී දෙවියන් වෙනුවෙන් දරුවන්ගේ ආරක්ෂාව පතා දේවාලයට විකිණීම ද සුලභ වේ. අපල කාල මග හැරුණු විට දෙවියන් වෙනුවෙන් අවශ්‍ය පුද පූජා පවත්වා පින් අනුමෝදන් කෙරේ.

මෙසේ ගජබා රජු දවස වර්ධනය වූ පත්තිනි ඇදහීම ප්‍රශස්තව ප්‍රචාරය වීමට බලපා ඇති කරුණු දෙකක් ඇත. එනම් මඩු ශාන්තිකර්ම හා කිරි අම්මාවරුන්ගේ දානයයි. බෝ වන ලෙඩරෝග දුරුවීම සඳහාත් සශ්‍රීකත්වය පතාත් මඩු ශාන්තිකර්ම පැවැත්වේ. දෙවියන්ගේ

1. පියතිලක හල්පෙ, එච්. එම්, **පත්තිනි දෙවියෝ** වාසනා පොත් ප්‍රකාශකයෝ, දංකොටුව, 2011, (**ප. දෙ.**), 28 පිටුව.

2. **දේවා. උ.** 28 පිටුව.

ලෙඩ හැදුනු විට, කිරිඅම්මා වෙනුවෙන් දානයක් දීමට පොරොන්දු වීම සාමාන්‍ය ගැමි සිරිතක් වී ඇත.

පතිතිනි දෙවියන් හා සම්බන්ධ ශාන්තිකර්මවලදී භාවිතයට ගැනෙනුයේ කෝල්මුර පොත් 35ක් බව පැවසේ. එම පොත් 35 තුළ කථා 35ක් අන්තර්ගතව ඇත. ඉන්දියාවේ සිට ගජබා රජු එන ගමනේ දී කේරළයේ තිබූ දෙමළ පොත් 7700ක් ගෙනා බව මඩු ශාන්තිකර්ම කාව්‍යාවලියේ කියැවේ.[1] එම පොත් ලක්වාසී පඬිවරුන් හා භික්ෂූන් විසින් සිංහලයට පරිවර්තනය කර සිංහල ශාන්තිකර්ම සාහිත්‍යයට එකතු කරන්නට ඇත.

පත්තිනි දෙවියන් පිළිබඳ ලියවුන විවිධ සාහිත්‍ය කෘති විශාල සංඛ්‍යාවක් රටතුළ ව්‍යාප්තව ඇත. පත්තිනිය මුල්කොට මඩු ශාන්තිකර්ම පවත්වන්නා වූ කපු පරම්පරාවල ශිල්පීන් එම කාව්‍යයන් තම පරම්පරාවලින් පිට භාවිතයට දීම ප්‍රතික්ෂේප කිරීම සුලභය. පත්තිනි දෙවියන් හා සෙසු දෙවිවරුන් සමඟ සම්බන්ධතා ඇති බව කලක සිට වැටහුනු බැවින් මෙම පර්යේෂණ මාතෘකාව වෙනුවෙන් කරුණු එක්රැස් කරන්නට වර්ෂ ගණනාවක් ගතවිය එයට හේතු වී ඇත්තේ පාරම්පරික ශිල්පීන් තොරතුරු සැපයීමට දක්වන මැලිකමයි.

මඩු යාගයේ දී පත්තිනි දෙවියන් හා සෙසු දෙවිවරුන් පුදනු ලැබුව ද මෙම දෙවිවරුන් අතර සම්බන්ධතාවයක් පවතින බව පර්යේෂණාත්මකව විග්‍රහවී නැත. මෙනයින් ශාන්තිකර්ම නිරීක්ෂණය කොට ලබාගත් තොරතුරු හා කෝල්මුර කවි සම්බන්ධකොට ගෙන ලංකාවේ ඇදහිල්ලට පාත්‍ර වූ පත්තිනි දෙවියන් හා සෙසු දෙවිවරුන් අතර සම්බන්ධතාවයන් පවතින බව පර්යේෂණාත්මකව ඉදිරිපත් කිරීම වැදගත් බව වැටහී ගියෙන් මෙම පර්යේෂණ කෘතිය සම්පාදනය කිරීමට කටයුතු කළෙමි.

---

1. (i) වත්මන් ලේඛක සතු කවි 68කින් සමන්විත **මහ මඩුපුර ගීය** අත්පිටපත (233 පිටුව) 46,47 කවි.

   (ii) **දේවා. උ.** 29,30 පිටුව.

   (ii) දසනායක, අමරකෝන්ගම, **පත්තිනි උපත, සිලප්පදිකාරම් මහා කාව්‍ය කථා සාරය** මොඩන් පොත් සමාගම, නුගේගොඩ, 2002, (**පත්. උ.**), xxix පිටුව.

   **නිවන් අත්වෙන හේතුවක් පෙර පාත්‍රා ධාතුව ද ගත්තේ**
   **රුවන් සළඹක් රැගෙන නිරිඳුන් සිරිලකට කෙළි පුද පැවැත්තේ**
   **ගිලන් දන්පස දෙමළ කව්පොත් සත්දහස් සත්සියක් ගත්තේ**
   **මෙවන් සමුදුර රැගෙන මහ නැව් තොටට රුවලුත් සදා ගත්තේ** (පත්. උ.)